# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 514 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 24/03/2024 පැය 1215

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.03.23 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 86 | 600 | තඹ දඟර 03<br>යකඩ බැරල් 06 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. වියළි ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුර.**

2024.03.23 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නුවරඑළිය පොලිස් වසමේ නුවරඑළිය බදුල්ල මාර්ගයේදී වැටලීමක් සිදු කර වියළි ගංජා කිලෝ 01 ග්‍රෑම් 500ක් සමඟ සැකකරුවකු අත්ඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා නුවරඑළිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30ක් වන හග්ගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

නුවරඑළිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. වියළි ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.03.23 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වලස්මුල්ල පොලිස් වසමේ ඔව්ලාන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර වියළි ගංජා කිලෝ 03 ග්‍රෑම් 440ක් සමඟ සැකකරුවකු අත්ඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා වලස්මුල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55ක් වන කොහුලානගොඩ, වලස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර.**

2024.03.23 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඉලුප්පුකඩවායි පොලිස් වසමේ කුරායි ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කල සැකකරුවකු ටිපර් රථය සමග අත්අඩංගුවට ගෙන ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35ක් වන වංගාලෙයි, මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ඉලුප්පුකඩවායි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**